## තොරතුරු පත්‍රිකාව

### නාට්‍යෝපකරණ

නළු නිළියන් රංගනයේද දී භාවිත කරනු ලබන උපකරණ නාට්‍යෝපකරණ ලෙස හැඳින්වේ.

සැබෑ ජීවිතයේ දී භාවිත කරන උපකරණ හා වේදිකා නාට්‍ය සඳහා භාවිත කරන උපකරණ අතර විශාල වෙනස්කම් දක්නට ලැබේ.

නාට්‍යයක් සඳහා නිර්මාණය කරනු ලබන නාට්‍ය උපකරණ වේ නම් ඒවා නාට්‍ය හා අත්‍යන්තයෙන් ම සම්බන්ධ ඒවා විය යුතුය. එනම් නාට්‍ය විකාශනයේ දී කවර අවස්ථාවක හෝ එම උපකරණ කවර හෝ අවශ්‍යතාවයක් සඳහා භාවිත වියයුතුය.

නමුත් නාට්‍ය උපකරණ භාවිත නොකරමින් අභිරූපන හෝ වෙනත් උපත් උපක්‍රම මගින් මේවා ප්‍රේක්ෂක මනසෙහි මවමින් රූපණය සිදු කරන අවස්ථා ද දක්නට ඇත.

නාට්‍ය උපකරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලෙස,

- සැහැල්ලු බව
- සරල බව
- නළු නිළියන්ට අපහසුවක් නොවන සේ නිර්මාණය කර තිබීම.
- ප්‍රවාහනයේ පහසුව.
- ශක්තිමත් බව.

### පැවරුම

1. නාට්‍යෝපකරණ යනු කුමක්දැයි හඳුන්වන්න.

2. ඔබ නැරඹූ නාට්‍යක දක්නට ලැබුණු නාට්‍යෝපකරණ ලියා දක්වන්න.

3. නාට්‍යෝපකරණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු ලියන්න.